www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ධනවාදයේ ලෝක අර්බුදය හා සමාජවාදය සඳහා ඉදිරි දැක්ම

## තුන්වන කොටස

## The world crisis of capitalism and the prospects for socialism Part three

**නික් බීම්ස් විසිනි**
**2008 පෙබරවාරි 2**

*පහත පලවන්නේ ජනවාරි 21 සිට 25 දක්වා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරදී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ විසින් පවත්වන ලද ජාත්‍යන්තර පාසැලට නික් බීම්ස් විසින් ඉදිරිපත්කරන ලද ආරම්භක වාර්තාවේ තුන්වන කොටස යි. බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙක් වන අතර ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම්ය.*

කඩා වැටීමක් හෝ බිඳ වැටීමක් නොවේ නම් පසුබෑමක් පිලිබඳ බිය හා වත්මන් තත්වය ගැන කනස්සල්ල පැනනගින්නේ මෙයට පෙර අවධිය තුල සිදු වූ එක්සත් ජනපදයේ ද සමස්තයක් වශයෙන් ලෝක ආර්ථිකයේ ම ද නයගැති භාවයේ අතිමහත් වර්ධනයෙනි. අපගේ ව්‍යාපාරය මුහුන දී සිටින ප්‍රශ්නය නම් අපගේ ඉදිරි දර්ශනයන් වර්ධනය කිරීම සඳහා මෙම අර්බුදය දරන්නාවූ අර්ථභාරය කවරේද යන්නයි.

දෙවසරකට පෙර පැවැත්වුනු අපගේ සාකච්ඡාව ආරම්භ කිරීමේ දී, ඩේවිඩ් නෝර්ත් පහත දැක්වෙන කාරනය මතුකලේය:

> "දේශපාලන පූර්වඥානයක් සඳහා දූරෙන කුමන බරපතල ප්‍රයත්නයක් වුව ද, වර්තමාන දේශපාලන තත්වය තුල පවත්නා ශක්‍යතාවන් පිලිබඳ කුමන තක්සේරුවක් වුව ද මුලපිරිය යුතු වන්නේ ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික වර්ධනය පිලිබඳ නිශ්චිත හා නිරවද්‍ය වැටහීමකිනි.
>
> "ධනවාදයේ ඓතිහාසික වර්ධනය පිලිබඳ විශ්ලේෂනය පහත සඳහන් සාරභූත ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුතු යඃ ධනවාදය ලෝක ආර්ථික පද්ධතියක් ලෙස ගමන් කරමින් පවතින්නේ ආරෝහක (ඉහලට ගමන් කරන) පථයක ද, එය තව මත් එහි මුදුනට නගිමින් පවතින්නේ ද? එසේත් නැත හොත් එය පවතින්නේ පරිහානියට යමින් ද එපමනක් නොව පාතාලයකට ඇද වැටෙමින් ද?
>
> "අප මෙම ප්‍රශ්නයට දෙන උත්තරය, අපගේ ප්‍රායෝගික වැඩ කටයුතු තෝරා බේරා ගැනීම සඳහා පමනක් නොව අපගේ ව්‍යාපාරයේ මුලු මහත් න්‍යායික සහ ක්‍රියාමාර්ගික දිශානතිය සඳහා ද අනිවාර්යයෙන් ම ඉතා දුරදිග යන බලපෑමක් ඇති කරයි. ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික තත්වය පිලිබඳව අපගේ විශ්ලේෂනය තීර්නය කරනු ලබන්නේ, සමාජ විප්ලවය උදෙසා වූ කිසියම් ආත්මීය ආශාවක් විසින් නො වේ. ඒ වෙනුවට විප්ලවවාදී ඉදිරි දර්ශනය මුල් බැසගත යුත්තේ සමාජ ආර්ථික වර්ධනයේ වෛෂයික ප්‍රවනතාවයන් පිලිබඳව විද්‍යාත්මක පදනමක් මත කෙරෙන ඇගැයීමක් තුල ය. අවශ්‍ය සමාජ-ආර්ථික පූර්වාවශ්‍යතාවන්ගෙන් වෙන් කර දමනු ලැබූ විප්ලවවාදී ඉදිරි දර්ශනයක් මනෝරාජික නිර්මිතයකට වැඩි දෙයක් විය නොහැකි ය." (ඩේවිඩ් නෝර්ත්, ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල රැස්වීමේ ආරම්භක වාර්තාව 2006 පෙබරවාරි 24/ ලෝක සමාජවාදී වෙබ් අඩවි විමර්ශන, 9 කලාපය, 2006 අප්‍රේල්-ජූනි, කතුවැකිය, පිටු 2-3-4 බලන්න.)

මෙම අර්බුදයේ පුපුරායාම නිසැකව ම සලකුනු කරන්නේ අපගේ විශ්ලේෂනය තුල අවධාරනය කර ඇති කේන්ද්‍රීය කාරනයයි. එනම්, භූගෝලීයකරනය, ධනවාදය එහි ප්‍රගතියේ නව අවධියක් තුලට ගමන් කරවනවා වෙනුවට 20 වන සියවසෙහි එය ව්‍යාධියට පත්කල සකල ප්‍රතිවිරෝධයන් ම උත්සන්න කරමින් විප්ලවයන් හා යුද්ධයන් පැන නංවන බවයි.

එහෙත් 'දැන් ධනවාදී පද්ධතිය නිසැකයෙන්ම යම් ආකාරයක ගැඹුරුවන ගැටලු, සමහරවිට අර්බුදයක් පවා අත් විඳිමින් පවත්නා නමුත්, එම අර්බුදය වනාහි ධනේශ්වර ක්‍රමයේ වර්ධනයට ඒ සා වැදගත් යයි සමස්ත ඉතිහාසය පුරාම සනාථ වී පවත්නා "නිර්මානශීලී විනාශයේ චන්ඩ මාරුත"වලින් එකක් යයි ද, එම කුනාටු හා කරදරවල අවධියෙන් පසුව සංවර්ධනයේ නවමු හා වඩා ස්ථායී ක්‍රියාවලියක් මතුවී යලි වතාවක්

සියල්ලේ වාසිය ගෙන සියල්ල හොඳ අතට පත්කරනු ඇතැයි' ද තර්ක කරන අපගේ විරුද්ධවාදීන් ඊට හරස් කැපීමට ඉඩ තිබේ.

අන්තිමේ දී ධනේශ්වර පද්ධතිය 1987 කොටස් වෙලඳපොල බිඳ වැටීමෙන් ගොඩ ආවේය. එසේ ම එය 1997-98 ආසියානු අර්බුදය, 1998 දිගු කාලීන ප්‍රාග්ධන කලමනාකරන බිඳවැටීම, කොටස් වෙලඳපොල හා ඩොට් කොම් බුබුල කඩා වැටීම ජයගත්තා සේම, වත්මන් නිවාස බුබුල හා අවමුඛ නයෙහි බිඳ වැටීම ද ජයගනු ඇතැයි ඔවුන් තර්ක කරනු ඇත.

එසේනම් වර්තමාන තත්වය තක්සේරු කලයුත්තේ කෙසේ ද? ධනපතියන් 'ඔව්' කියන "කල" නැහැ කීමෙන් හා එහි අනෙක් පැත්ත යෙදීමෙන් නොවේ. අගැයීම අප විසින් කල යුත්තේ ඉහතකී නැඟීම් පහල කල ක්‍රියාවලිය පිලිබඳ ඓතිහාසික විශ්ලේෂනයක් මඟින්ය.

මාක්ස්වාදය ඉදිරි දර්ශනයේ විද්‍යාව; එහි විශ්ලේෂනයේ මාහැඟි උපකරනවලින් එකක් නම් ට්‍රොට්ස්කි 1921 තුන්වන ජාත්‍යන්තරයේ තුන්වන සමුලුවට ඉදිරිපත් කල ඔහුගේ සුප්‍රකට වාර්තාවේ ද ඉන් පසුව 1920 ගනන්වල වාර්තා හා සාකච්ඡාවන්හි දී ද යොදා ගත් ධනේශ්වර සංවර්ධනයේ චක්‍රය පිලිබඳ සංකල්පයයි.

එම වාර්තාව තුල, ට්‍රොට්ස්කි, ධනවාදයේ උපතේදී ම හටගන්නා හා එහි මරනය තෙක් ම පවතින්නාවූ උත්පාතය, අර්බුදය, පසුබෑම, ගොඩඒම හා යලි උත්පාතය යන ව්‍යාපාර චක්‍රය විසින් බිහිකෙරෙන වෙනස්කම් ද, මෙම ආර්ථික චක්‍ර ක්‍රියාත්මක වන්නාවූ පසුබිම වන ධනේශ්වර සංවර්ධනයේ දිගු කාලීන අවධීන් ද අතර වැදගත් බෙදුම්කඩනයක් සලකුනු කලේය.

ඔහු ලෝක වෙලඳමේ සංඛ්‍යා උපයෝගීකර ගනිමින්, පූර්ව සියවසේ ධනේශ්වර සංවර්ධනයේ වෙනස් අවධීන් පෙන්නුම් කලේය. 1781 සිට 1851 දක්වා අවධිය තුල "සංවර්ධන චක්‍රයේ" සාපේක්ෂ මන්දගාමී ඉහල නැඟීමක් පෙන්නුම් කලේය. පරාජය වූ නමුත් ඉන්පසුව යුරෝපයේ ධනේශ්වර වෙලඳපොල සඳහා වූ රාමුව ප්‍රසාරනය කර දුන් 1848 විප්ලවයෙන් ඉක්බිති 1873 දක්වා පැවති තියුනු ඉහල නැග්මක් සටහන් විය. එම වසරේ හටගත් බැංකු හා මූල්‍ය අර්බුදය ක්‍රමයෙන් පහව ගිය ද, පෙර පැවති තත්වය යලි පැමිනියේ නැත. ඒවෙනුවට ඊලඟ 20 වසර අංග ලක්ෂිත වූයේ මිල ගනන් හා ලාභ පහත වැටුනු අවපාතයකිනි. කෙසේ වුවද 1890 ගනන් මැද භාගයේ සිට, වර්ධන චක්‍රයෙහි ඉහලට යොමුවක් පැවතුනි. ඉක්බිතිව එය කුලුගැන්වුනේ 1913 අර්බුදය ද හා 1914 යුද්ධය ද පැනනැඟීමෙනි.

මෙම හැසිරීම් දෙක අතර පැවතියේ මතු දැක්වෙන ආකාරයේ සම්බන්ධයකි: මූලික චක්‍රයේ ඉහලට නැඹුරුවක් සහිත අවධීන්හි දී උත්පාතයන් දිගුවන අතර අර්බුද සාපේක්ෂව කෙටි වේ. අනෙක් අතට පහලට ලුහුටන අවධීන්හි දී උද්ගත තාවකාලික ද සමපේක්ෂනාත්මක ද වන අතර පසුබැසීම් වඩාත් දිග්ගැස්සුනු ස්වභාවයක් ගනී.

1920 ගනන්වල ලිපිලේඛන හා සාකච්ඡා මාලාවක් තුලදී ට්‍රොට්ස්කි සිය විශ්ලේෂනය තවදුරටත් විස්තාරනය කලේ විශේෂයෙන් ම ධනේශ්වර වර්ධනයේ දිගුකාලීන අවධීන්ද චක්‍රයන් ලෙස ම අංග ලක්ෂනය කල යුතු යයි කියාසිටි ධනේශ්වර අර්ථශාස්ත්‍රඥයෙක් හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ කොන්ඩ්‍රාටියෙව්ගේ විශ්ලේෂනය අභියෝගයට ලක් කරමිනි. එය වනාහී

වචන යෙදීම පිලිබඳ මතභේදයක් නොව ඉදිරි දර්ශනය පිලිබඳ අති මූලික ප්‍රශ්නවලට ආදාල වූවකි.

"සුලු චක්‍රයන් ආවර්තිත පුනරාවර්තනය, (කලින් කල යලි යලිත් කැරකී ඒම) ධනවාදී බලවේගයන්ගේ අභ්‍යන්තර ගතිකය විසින් හැඩ ගැස්වෙන අතර වෙලඳපොල පැන නගින සෑම විටෙක ම හා සෑම තැනක ම විද්‍යමාන වේ. චක්‍රයන් ලෙස නම් කල යුතු යයි මහාචාර්ය කොන්ඩ්‍රාටියෙව් අපරීක්ෂාකාරී ලෙස යෝජනා කරන ධනේශ්වර සංවර්ධන චක්‍රයේ දිගු ඛාන්ඩයන් (වසර පනහක්) සලකා බලන කල පෙනී යන්නේ ඒවායේ ස්වභාවය හා කාලසීමාව ඇතුලත අන්තර් ක්‍රියාකාරීත්වය මඟින් නොව ධනේශ්වර වර්ධනය ගලා යන්නේ කුමන ඇලමං තුලින් ද යන බාහිර කොන්දේසි මඟින් නීර්නය කෙරන බවය.

ධනවාදය විසින් අලුත් රටවල් හා මහාද්වීප අත් කර ගැනීම, නව ස්වාභාවික සම්පත් සොයා ගැනීම හා ඒ සියල්ල පසුපස යුද්ධ හා විප්ලව වැනි 'උපරි ව්‍යුහාත්මක' පර්යායේ ඒ සා මූලික සාධකයෝ ධනේශ්වර වර්ධනයේ අවධීන්ගේ නැඟීම, එකතැන පල්වීම හෝ බැසීමේ ස්වභාවය හා ආදේශනය තීන්දු කරතැ"යි ට්‍රොට්ස්කි ලිවීය. (ට්‍රොට්ස්කි, "ධනේශ්වර සංවර්ධනයේ චක්‍රය" - [*Problems of Everyday Life*, (දෛනික ජීවිතයේ ගැටලු), පාත්ෆයින්ඩර්, 2005, 341-342 පිටු]

ධනේශ්වර සංවර්ධනයේ දිගු කාල පරාසයන් චක්‍රයන් හඳුන්වාදෙන කොන්ඩ්‍රාටියෙව්ගේ විස්තරය (කෙටිකාලීන) පසුබෑමකින් අනතුරුව ව්‍යාපාරික චක්‍රය යලි පනගැන්වෙන්නා සේ ම යටි නැඹුරුවක කුමන අවධියකින් හෝ පසුව අනිවාර්යෙන්ම උඩු නැඹුරුවක් ඇතිවන බැවින් ධනේශ්වර පර්යාය බිඳ නොවැටෙන්නේයයි කියා සිටින සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ඉදිරිදර්ශනය සමඟ බැඳී ඇත.

1920 ගනන්වල ලෝක තත්වය විමසා බලන ට්‍රොට්ස්කි, ධනේශ්වර සංවර්ධන චක්‍රයේ උඩු නැම්මක හැකියාව බැහැර නොකරයි. එහෙත් එය සිදුවිය හැක්කේ යුරෝපීය ආර්ථිකයට

ප්‍රචන්ඩ ලෙස තිරිංග දැමීමක් මගින් දශලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් ඝාතනය කිරීම තුලින් ම පමනි.

ධනේශ්වර චක්‍රයේ නව ඉහල නැඟීමක් සිදුවිය හැක්කේ කොමියුනිස්ට් ජාත්‍යන්තරය හා එහි ශාඛා ඉදිරි වසරවල දී තමන් ඉදිරියට එන විප්ලවකාරී අවස්ථා ග්‍රහනය කර ගැනීමට අසමත් වන්නේ නම් පමනි

අප දන්නා පරිදි ට්‍රොට්ස්කි එකල්හි උපන්‍යාසයක් ලෙස පමනක් සැලකිල්ලට ගත් මෙම කොන්දේසි පසුකලෙක සාක්ෂාත් විය. විප්ලවවාදී අවස්ථා ග්‍රහනය කරගනු නොලැබුනා පමනක් නො වේ; කොමියුනිස්ට් ජාත්‍යන්තරය ස්ටැලින්වාදී නිලධරයේ අධිපත්‍යය විසින් ලෝක අධිරාජ්‍යවාදයේ ප්‍රතිවිප්ලවවාදී ඒජන්සියක් බවට ද පරිවර්තනය කැරුනේ ද විය.

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ධනේශ්වර වර්ධන චක්‍රයේ අලුත් ඉහල නැඟීමක් ඇතිවිය. ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් වර්ධනය කැරුනු ඉහල නිෂ්පාදන විධික්‍රම අවශේෂ ලෝකයට පැතිරයාම මගින් ප්‍රසාරනය වූ කම්කරු පන්තියෙන් උපුටා ගත් අතිරික්ත වටිනාකම් සංචිතය සමස්තයක් ලෙස ධනේශ්වර ක්‍රමයේ ලාභානුපාතය ඉහල දැමීය.

එහෙත් ට්‍රොට්ස්කි විශ්ලේෂනය කල පරිදි මෙම ඉහල නැඟීමට හැකියාව ඇති කලේ, උපරි ව්‍යුහය තුල ඇතිවූ ප්‍රගාඪ වර්ධනයන් මගිනි. විශේෂයෙන් ම යුද්ධයේ අග භාගයේ හා පශ්චාත් යුද්ධ අවධියේ මුල භාගයේ පැනනැගි කම්කරු පන්තියේ විප්ලවවාදී නැඟීරීම් ස්ටැලින්වාදී නිලබලතන්ත්‍රයන් විසින් පාවාදීම ද ඇමරිකානු අධිරාජ්‍යවාදය යුද්ධයට පිවිසීම ද මගින් ගෙන ආ ජාත්‍යන්තර දේශපාලන සබඳතාවන්ගේ ඉමහත් වෙනස්කම් ද විසිනි.

ඇමරිකානු ධනවාදයේ දැවැන්ත වර්ධනයත් 1930 ගනන්වල ලෝකය ආවෘත අධිරාජ්‍යයන් ගනනාවකට බෙදීයාමත් අතර ප්‍රතිවිරෝධයේ පුපුරනසුලු ප්‍රතිවිපාක ට්‍රොට්ස්කි ඒ වන විටත් පෙන්වාදී තිබුනි. -බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය, ආසියාව දිග්විජය කිරීමේ ලා ජපානයේ ධාවනය හා යුරෝපයේ ආධිපත්‍යය සඳහා නාසි තන්ත්‍රයේ මහාභිලාෂයන් යන මේවා "ජාතිකවාදය හා ආර්ථික ජීවිතය" යන මාතෘකාවෙන් 1934 දී ප්‍රකාශයට පත් කැරුනු ට්‍රොට්ස්කිගේ සුප්‍රකට ලිපිය තුල අන්තර්ගත ය.

ලිපිය ආරම්භ වන්නේ මානව සමාජයේ පරිනාමය කෙරෙහි ශ්‍රම පලදායීතාවය වර්ධනය වීම දරන්නා වූ අර්ථභාරය පෙන්වා දෙමිනි. අවසාන විග්‍රහයේ දී එක් වර්ගයක සමාජ ක්‍රමයක් සඳහා වෙනත් එකක් - ම්ලේච්ඡත්වය වහල් ක්‍රමය මගින් ද, වහල් ක්‍රමය ප්‍රවේනිදාස ක්‍රමයෙන් ද, වැඩවසම්වාදය ධනවාදය යටතේ වැටුප් ශ්‍රම පද්ධතියකින් ද ආදේශ කලා වූ සමාජ ක්‍රමයන්ගේ ස්වභාවය නිශ්චය කරන හා තීරනය කරන ප්‍රගාඪ මිනුම්දන්ඩ වූයේ ශ්‍රම පලදායීතාවයයි.

1930 ගනන්වල පැවති කොන්දේසි තුල ශ්‍රම පලදායිතාවය පිලිබඳ මෙම නියාමය දිස් වූයේ කෙසේද?

"එක්සත් ජනපදය ධනේශ්වර සංවර්ධනයේ අතිශයින්ම පරිපූර්න ස්වරූපය නියෝජනය කලේය. පෙනීයන පරිදි ක්ෂය වී නොයන එහි අභ්‍යන්තර වෙලඳපොලේ සාපේක්ෂ සමතුලිතය, එක්සත් ජනපදයට යුරෝපය මත තීරනාත්මක තාක්ෂනික හා ආර්ථික ආධිපත්‍යයක් සහතික කලේය. එහෙත් ලෝක යුද්ධයට එක්සත් ජනපදයේ මැදිහත්වීම වනාහී එහි අභ්‍යන්තර සමතුලිතයට දැනට මත් බාධා පැමින ඇතැයි යන්නෙහි සැබෑ ප්‍රකාශනයකි. ඇමරිකානු ව්‍යුහය තුලට යුද්ධය මගින් ඇතුලු කැරුනු වෙනස්කම් අනෙක් අතට ලෝක කරලියට ද අවතීර්න වීම ඇමරිකානු ධනවාදයට ජීවිතයත් මරනයත් පිලිබඳ ප්‍රශ්නයක්ව තිබේ. මෙම අවතීර්න වීම අතිශය නාටකීය රූපයන් ගනු ඇතැයි යන්න පිලිබඳ සැලකිය යුතු තරම් සාක්ෂි ඇත.

"ශ්‍රම පලදායිතාවයේ නියාමය ඇමරිකාව හා යුරෝපයේ අන්තර් සම්බන්ධතා කෙරේ තීරනාත්මකව වැදගත් වෙයි; එය පොදුවේ, ලෝකය තුල ඇමරිකාවේ අනාගත තැන ද තීරනය කරයි. ශ්‍රම පලදායිතාවයේ නියාමයට යැංකීන් ලබා දුන් ඉහල ම රූපය හැඳින්වෙන්නේ පිරිද්දුම් වාහක, ප්‍රමිතිගත හෝ මහා පරිමාන නිෂ්පාදනය නමින්ය. ලෝකය උඩුයටිකුරු කිරීම සඳහා ආකිමීඩිස්ගේ ලීවරයට අවශ්‍ය වූ ආධාරකය සොයා ගෙන ඇති බවක් පෙනී ගියේය. එහෙත් පැරනි ග්‍රහයා (ලෝකය) පෙරලා දමනු ලැබීම ප්‍රතික්ෂේප කලේය. සෑම රටක් ම තීරුබදු තාප්පයකට හා බයිනෙත්තු වැටකට මුවාවී සෙසු සියල්ලන්ගෙන් ම ආරක්ෂා වීගැනීමට මාන බැලීය. භාන්ඩ මිලට නොගන්නා, නය නොගෙවන යුරෝපය ඒ මදිවට අවි අතට ගනී. සාගින්නෙන් පෙලෙන ජපානය කාලකන්නි සේනාංක පහක් මගින් මුලු රටක්ම (චීනය) යටත් කර ගනියි. දැන් පෙනීයන්නේ ලොව දියුනුම තාක්ෂනය හිටිහැටියේ දක්වා සිටින්නේ පහත්ම තාක්ෂනය මත පදනම් වන බාධක ඉදිරියේ බෙලහීන බවට පත්ව ඇති ලෙසකි. ශ්‍රම පලදායිතා නියාමය බල රහිතව ගිය සෙයක් පෙනීයයි.

"එහෙත් එසේ පෙනීයනවා පමනි. මානව ඉතිහාසයේ මූලික නියාමය නොවරදවා ම නිෂ්පන්න හා ද්වීතීයික ගනයේ සංසිද්ධීන්ගෙන් පලිය ගත යුතුය. ඇමරිකානු ධනවාදය ඉක්මනින් හෝ කල් පසුව අපගේ ග්‍රහලෝකයේ දිගට හරහට තමන් සඳහා මාවත් විවෘත කර ගත යුතු ය. කුමන ක්‍රමෝපායන් ගෙන් ද? සියලු ක්‍රමෝපායන් ගෙන්ය. පලදායිතාවයේ ඉහල සංගුනකය විනාශකාරී බලයේ ඉහල සංගුනකය ද ඇඟවුම් කරයි. මා මේ කරන්නේ යුද්ධය දේශනා කිරීම ද? කිසි සේත් ම නැත; කිසිවක් දේශනා නොකරමි; උත්සාහ කරන්නේ ආර්ථික යාන්ත්‍රනයේ නියාමයන්ගෙන් නිගමන උපුටා

ගැනීම සඳහා ලෝක තත්වය විශලේෂනය කිරීමට උත්සාහ කිරීම පමනි." [Trotsky *Writings,* (ට්‍රොට්ස්කිගේ ලියවිලි), 1933-34, පාත්ෆයින්ඩර් 1975, 161-62 පිටු ]

ඇමරිකානු ධනවාදය දෙවෙනි ලෝක යුද්ධයට මැදිහත් වූ මූලික ප්‍රශ්නය වූයේ ප්‍රජාතන්ත්‍රවාදය නොව, භාන්ඩ හා ප්‍රාග්ධනයේ නිදහස් සංසරනය ද පැරනි අධිරාජ්‍යයන් අවසන් කිරීම සහතික කර ගැනීම සඳහා ලෝක ආර්ථිකය ප්‍රතිසංස්කරනය කිරීම ද වේ.

ලෝක ආර්ථිකයේ පශ්චාත් යුද්ධ ප්‍රතිව්‍යුහකරනය ධනේශ්වර සංවර්ධන චක්‍රයේ නව ඉහල නැගීමක හැකියාව ඇති කලේය. ඒ ලාභානුපාතිකය සුරක ඉහලට නැංවිය හැකි දියුනු නිෂ්පාදන විධික්‍රමයන්ගේ ව්‍යාප්තිය හා වර්ධනය සහතික කිරීම මගිනි.

එහෙත් ධනේශ්වර නොනැසී පැවති පද්ධතියේ සියලු ප්‍රතිවිරෝධයෝ 1960 ගනන් මැද වනවිට ලාභානුපාතයේ පහත වැටීමෙන් ඉස් මත්තට පැමිනීම ඇරඹුනි. පශ්චාත් යුද්ධ උත්පාතයේ අවසානය කම්කරු පන්තියේ නැගීමක් මඟින් සලකුනු විය. එක්සත් ජනපදයේ සසප ජාතික සමුලුවට කල ප්‍රකාශයන් තුල ඩේවිඩ් නෝර්ත් නිවැරදිව පෙන්වාදුන් පරිදි, මෙම අවධියේ මූලික ලක්ෂනය වූයේ නව වාමාංශයේ න්‍යායවේදීන් කියාසිටි පරිදි ශිෂ්‍යයන්ගෙන් සමන්විත "නව පෙරටු බලඇනියක" නැගී ඒම නොව කම්කරු පන්තිය මතුව ඒම ය.

දියුනු ධනපති රටවල දී කම්කරු පන්තිය තවදුරටත් විප්ලවවාදී බලවේගයක් නොවේ යයි කියාසිටි ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ න්‍යායික කුලුගැන්වීම වූ මාක්‍යුස්ගේ *One Dimensional Man* (ඒක මානීය මිනිසා) නම් කෘතිය 1964 දී පලවිය.

ඔහු මෙසේ ලිවීය: "සමාජය පිලිබඳ විවේචනාත්මක න්‍යාය මූලාරම්භක අවධියේ දී ස්ථාපිත සමාජය තුල ප්‍රගමනයේ බාධකයන් බවට පත්ව තිබූ ස්ථාපිත ආයතන අහෝසිකර වඩාත් තර්කාන්විත හා නිදහස් ඒවා නිර්මානය කිරීම කරා යොමු වූ (හෝ යොමු කල හැකිවූ) වෛෂයික මෙන්ම ආත්මීය ද වූ යථා බලවේගවලට මුහුන දී සිටියේ ය. එම න්‍යාය ගොඩනංවනු ලැබුවා වූ අනුභූතික පදනම ඒවා විය. එම බලවේග තුලින් උපුටා ගනු ලැබූ, එතෙක් වෙනත් ආකාරවලින් අවහිර කොට විකෘති කරන ලද අවශ්‍යතා ද ශක්‍යතා ද මුදාහැරීම හා ඒවායේ ද්‍රව්‍යමය හා බුද්ධිමය පලදායිතාව වර්ධනය කිරීම එම න්‍යාය ගොඩනැංවුනු අනුභූතික පදනම විය. එහෙත් සමාජය පිලිබඳ විවේචනය එහි තර්කාන්විත භාවය තම පද භාවිතය ඓතිහාසික භාවිතය බවට පරිවර්තනය කිරීමට අසමත් වනු ඇත. මෙහි නිගමනය නම්, 'නෛසර්ගික හැකියාවන්ගේ විමුක්තිය' තවදුරටත් ඓතිහාසික විකල්පය සඵල ලෙස ප්‍රකාශයට පත් නොකරන බවයි."

මේ වනාහී කම්කරු පන්තිය ධනේශ්වර පර්යායේ ව්‍යුහය තුලට මුලුමනින්ම අවශෝෂනය කර ගෙන තිබූ බව ප්‍රකාශ කිරීමකි. පිටමංකැරුනවුන් හා පිටස්තරයන් ගෙන් සමන්විත යටතට්ටුවක් වන අනෙකුත් බලවේග එකම විප්ලවවාදී විරුද්ධත්වය සම්පාදනය කල බවක් කියා පෑමකි.

එහෙත් ඉන් සිව් වසරක් ගතවන විට ඉතිහාසයේ විශාලතම වැඩ වර්ජනයෙන් ප්‍රන්සය ඇලලී ගියේය. ලෝකයේ සියලු ම ප්‍රධාන රටවල් ආර්ථික හා දේශපාලන අරගල මාලාවකින් සසල විය. පූර්ව අවධියකදී ට්‍රොට්ස්කි පැහැදිලි කර තිබූ පරිදි ශිෂ්‍යයන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් වැඩි වර්ධනය වීම පෙන්නුම් කලේ නව සමාජ බලවේගයක් මතුව ඒමක් නොව සමාජය පතුලෙහි සිදුවෙමින් තිබෙන ගැඹුරු චලනයන් එහි වඩාත් සලිතවන කොටස් තුලින් ප්‍රකාශයට පත්වීමක් පමනි.

1968 සිට 1975 දක්වා ඇතිවූ විප්ලවකාරී නැගිටීම්, පශ්චාත් යුද්ධ අවධිය තුල හතරවන ජාත්‍යන්තරය දුබල කර එයට වලකැපීම සඳහා ක්‍රියාත්මක වූ පැබ්ලෝවාදී ප්‍රවනතාවන්ගේ තීරනාත්මක සහයෝගයද ඇතිව කම්කරු පන්තියේ ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් විසින් පාවාදෙනු ලැබිනි. ඔවුහු 1960 ගනන්වල හා 1970 ගනන්වල මුලදී සිදුවූ නැගිටීම් තුල ධනේශ්වර පර්යාය රැක දීමේ ලා තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කලහ. 1964 දී බන්ඩාරනායක ආන්ඩුවට ඇතුල්වීගත් ඔවුහු එමගින් ශ්‍රීලංකාව තුල පමනක් නොව උප මහාද්වීපය හා සමස්ත ආසියානු කලාපය පුරාම දේශපාලන තත්වය ස්ථාවර කර දීමේ තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කලහ.

ධනේශ්වර සංවර්ධන චක්‍රයේ පශ්චාත් යුද්ධ නැග්මේ අවසානය සලකුනු කලේ 1973 උද්ධමනයේ ආරම්භය හා එම අවධිය තුල ගැඹුරුම තැනට එලඹි 1974-75 අවපාතය මඟින්ය. 1975 න් පසුව ව්‍යාපාර චක්‍රයේ පුනර්ජීවයක් ඇතිවූ නමුදු එය 1960 ගනන්වල වර්ධන අනුපාතය හා ලාභදායිකත්වය කරා ආපසු පැමිනීමක් නොවීය. ඒ වෙනුවට මතුව ආවේ නව සංසිද්ධියකි. එනම් එක දිගට පවතින ඉහල සේවා වියුක්ති මට්ටම් හා ඉහල උද්ධමනයේ සංයෝජනයක් වන (ස්ටැග්ෆ්ලේෂන්) අති උද්ධමනකාරී තත්වයකි.

මෙය ධනේශ්වර ආර්ථිකය දැන් ආන්ඩු ලවා පාලනය කරගතහැකි නිසා මාක්ස්වාදය යල්පැන ඇතැයි කියාසිටි සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කේන්සියානු විසඳුම් මගින් තත්වය තවත් ඔද්දල් කැරැනි. 1976 සැප්තැම්බරයේ පැවති ලේබර් පක්ෂ සමුලුවේදී අගමැති ජේම්ස් කැලහන් ගෙන් ඔවුන්ගේ නිල හුමදානය සිදුවූවායයි කිවහැකි ප්‍රකාශය නිකුත්විය. "බදු කපාහැර ආන්ඩුවේ වියදම් ඉහල නැංවීමෙන් සේවා නියුක්තිය වැඩිකර අවපාතයෙන් ගැලවිය හැකිය යි අපි කලක් විශ්වාස විශ්වාස කලෙමු. මා මුලුමනින්ම අව්‍යාජව

ඔබට කියන්නේ එම විකල්පය තවදුරටත් ඇත්තේ නැති බවය."


ධනේශ්වරය දේශපාලන තත්වය ස්ථායී කර ගැනීමෙන් පසුව ප්‍රති ප්‍රහාරයට ගමන් කලේය. ලාභානුපාතයේ වැටීම කෙරෙහි පලවූ ප්‍රතිචාරයේ පැති දෙකක් තිබුනි. එකක් කම්කරු පන්තියේ වැටුප් හා ජීවන කොන්දේසි පිරිහෙලීමේ ව්‍යායාමය යි. අනෙක ප්‍රාග්ධනයේ පාඩු ලබන අංශ දැවැන්ත ආකාරයෙන් වැනසීම ය. රේගන් හා තැචර් විසින් ක්‍රියාත්මක කල වැඩ පිලිවෙලේ සාරභූත අන්තර්ගතය වූයේ මෙයයි. එයට මුල පිරුනේ, ඩිමොක්‍රටික් ජනාධිපති ජිමී කාටර්ගේ 1979 දී, පද්ධතිය තුලින් උද්ධමනය මිරිකා හැරීමේ අරමුනෙන් ෆෙඩරල් රිසර්ව් මන්ඩලයේ සභාපති ලෙස පෝල් වෝකර් පත්කිරීමත් සමඟය.

කිසි සේත් ම හුදු ආර්ථික ප්‍රතිපත්තිය පිලිබඳ ප්‍රශ්නයක් නොවූ මෙය පන්ති අරගලයේ වර්ධනයත් සමඟ ක්ෂනිකව ම බැඳීගත්තේය. තනතුර භාරගත් වහාම, වෝකර් නය පහසුකම් සැලසීමට හිලව් වශයෙන් වැටුප් කැපීම් මාලාවකට කරලිය සැකසූ 1980 ක්‍රයිස්ලර් සමාගම බංකොලොත් වීමට තුඩුදුන් ක්‍රියාවලියට සෘජුව ම මැදිහත් විය. 1981 දී ගුවන් ගමන් පාලක වරුන් ගෙන ගිය වැඩ වර්ජනය තලාදැමීම හා ඔවුන්ගේ වෘත්තීය සමිතිය (පැට්කෝ) විනාශකිරීමේ වැදගත්කම ඔහු පසුව මෙසේ පිලිගත්තේය. "රේගන් පරිපාලනය විසින් ප්‍රති උද්ධමන අරගලයට සහාය දෙනු පිනිස ගනු ලැබූ ක්‍රියා අතුරෙන් වඩාත්ම වැදගත් එක වූයේ ගුවන් ගමන් පාලකවරුන්ගේ වැඩ වර්ජනය පරාජය කිරීමය."

ඒඑෆ්එල්-සීඅයිඕ වෘත්තීය සමිතියේ පාවාදීම මගින් ඉටු කැරුනු ගුවන් ගමන් පාලක වරුන්ගේ පරාජය එක්සත් ජනපදයේත් ජාත්‍යන්තරවත් කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරයක ආරම්භය සලකුනු කලේය. බ්‍රිතාන්‍යයේදී එහි සන්ධිස්ථානය වූයේ 1984-85 පතල් කම්කරු වර්ජනයේ පරාජය යි. ඕස්ට්‍රේලියාවේදී, 1982-83 ෆ්‍රේස්රගේ ලිබරල් ආන්ඩුව බිඳවැටීමෙන් පසුව හෝක්-කීටින් ලේබර් ආන්ඩුව කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරයට මුල පිරීය.

වෝකර් විසින් හඳුන්වා දුන් පොලී අනුපාතික ඉහල දැමීම 1930 ගනන්වලින් පසුව ගැඹුරුම පසුබෑම වන 1982-83 අවපාතය මුදාහැරීමට දායක විය. තරම පහත සටහනෙන් පොලී අනුපාතික කොතරම් ඉහල නංවන ලද්දේ දැයි පැහැදිලි වේ.

Figure 2. Advanced World's Long Real Interest Rate
(Percent a year)




පොලී අනුපාතයේ නැගීම ඊනියා සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි මූලික බලපෑමක් ඇති කලේය. 1973-74 තෙල් මිල ඉහල නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස එම රටවල් උග්‍ර නයගැති භාවයකට ඇද වැටුනි. මූර්ත අගය මත අපනයන මිලගනන් වැටෙන්ට පටන් ගැනීමත් සමඟ නය ආපසු ගෙවීම් ඉහල නැංගේය. මෙය අද දක්වා ම පවතින ක්‍රියාවලියක් මුදාහලේය. එනම්, සම්පත් ලෝකයේ දුප්පත්ම රටවල් සමහරක් වෙතින් ප්‍රධාන බැංකු හා මූල්‍ය ආයතන වෙත මාරුකිරීමයි.

පහත දැක්වෙන සංඛ්‍යාවන් මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵල එලිදක්වයි. 1970 දී ලෝකයේ දුගීම රටවල් ( ලෝක බැංකුව විසින් පහල ආදායම් සහිත රටවල් ලෙස වර්ග කල රටවල්වලින් දල වශයෙන් 60 ක්) මත පැටවුනු නය ඩොලර් බිලියන 25 ක් විය. 2002 දී මෙය බිලියන 523 කි. 1970 දී අප්‍රිකාවේ නය බිලියන 11 කට ආසන්න විය. 2002 දී එය බිලියන 295 කි. පසුගිය දශක තුන තුල බිලියන 540 ක නයෙන් වාරික හා පොලිය වශයෙන් බිලියන 550 ක් ආපසු ගෙවා ඇතත් තව බිලියන 523 ක නය බරක් ඉතිරිව ඇත.

(බලන්න http://www.globalissues.org/TrdeRelated/Debt/Scale.asp )

## මතු සම්බන්ධයි

© www.wsws.org